# තනතුරු ඇබෑර්තු

**සී/ස මීරිගම විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුර සඳහා සුදුසුකම්ලත් ගම්පහ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගෙන් 2022-01-01 දින සිට 2022-01-15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.**

| තනතුර | වැ.ප. අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතන හා සංවර්ධන) | 102-4<br>111 ශ්‍රේණිය | 01 | 21474-380X10-450X10-580X10-35574 |

02. මෙම තනතුර ස්ථිරය, සමුපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.

03. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) 102-5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුනක හෝ 102-6 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහකට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ආ) තනතුරේ ක්ෂේත්‍රයට අදාළ වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් සමග 103-7 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර හතකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමග තනතුරට අදාළ රැකියා ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක වසරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

04. වයස් සීමාව - 26 - 45

05. අයදුම්පත්‍රය යොමු කිරීම.

I. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සී/ස මීරිගම විවිධ සේවා සමුපකාර සමිතියේ ......නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතුය.

II. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2022-01-15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට ද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

- සමිති බල ප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දේ.

**සභාපති,**
**සී/ස මීරිගම විවිධ සේවා සමුපකාර සමිතිය,**
**ගිරිඋල්ල පාර,**
**මීරිගම.**